# කාර්යයසාධන වාර්තාව

# 2014

**රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව**

# දැක්ම

### ශ්‍රී ලංකාවේ රාජ්‍ය ව්‍යාපාරවල යහපාලනය සහතික කරනු

### ලබන ප්‍රධානතම ආයතනය බවට පත්වීම

# මෙහෙවර

### රාජ්‍ය ව්‍යාපාරවල කාර්යසාධනය උපරිමත්වයට පත්කිරීම

### සඳහා, විශිෂ්ඨ පරිචයන් භාවිතා කරමින් යහපත්

### අභිලාෂයන් සුරක්ෂිත කරනු පිණිස රාජ්‍ය ව්‍යාපාරවල

### යහපාලනය ශක්තිමත් කිරීම

# පටුන

1. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය....3
1.1 සමාලෝචනය....3
2. 2014 කාල පරිච්ඡේදය තුල රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් ඉටු කල ප්‍රධාන කාර්යයන් ....3
3. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයට යටත් වන රාජ්‍ය ව්‍යවසායන්හි භෞතික කාර්යය සාධනය6
3.1 මහා භාණ්ඩාගාරයට ගෙවන අයභාර හා ලාභාංශ....6
3.2 රාජ්‍ය ව්‍යවසායන්හි සේවා නියුක්තිය ....7
3.3 රාජ්‍ය ව්‍යවසායන් සඳහා අයවැය ප්‍රතිපාදන....7
3.4 ක්‍රමෝපායන් වශයෙන් වැදගත් වන රාජ්‍ය ව්‍යවසායන්හි මූල්‍ය තත්ත්වය ....7
4. රාජ්‍ය ව්‍යවසායන්හි කාර්ය සාධනය වැඩිදියුණු කිරීම සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ දායකත්වය....7
4.1 රාජ්‍ය ව්‍යවසායන්ගේ කාර්යසාධනය වැඩිදියුණු කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග හා නිර්දේශයන්....7
5. මානව සම්පත් කළමනාකරණය....17
6. මූල්‍ය කළමනාකරණය ....20
ඇමුණුම I: 2014 වර්ෂය තුල දී දෙපාර්තමේන්තුව විසින් සහභාගි වූ කෝප් රැස්වීම් ....21
ඇමුණු II: රාජ්‍ය ව්‍යවසායන්හි වාර්ෂික වාර්තා භාර දීම ....22
ඇමුණුම III : රාජ්‍ය ව්‍යවසායන්ගෙන් ලද අයභාර/ලාභාංශ ආදායම ....24
ඇමුණුම IV : රාජ්‍ය ව්‍යවසායන් සඳහා අයවැය ප්‍රතිපාදන ලබා දීම....26
ඇමුණුම V : 2014.12.31 දිනට රාජ්‍ය ව්‍යවසායන් 55 හි මූල්‍ය තත්ත්වය....27

## 1. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය

### 1.1 සමාලෝචනය

රජය සතු ව්‍යවසායන්හි කාර්ය සාධනය නිරීක්ෂණය සඳහාත්,1971 අංක 38 දරණ මුදල් පනතේ විධිවිධාන පරිදි රාජ්‍ය සංස්ථාවන්හි මූල්‍ය පාලනය, කටයුතු පරිපාලනය කිරීමටත්, ඒකාබද්ධ/සංස්ථාපිත සහපාලනය මඟින් රාජ්‍ය ව්‍යවසායන්හි කාර්යසාධනය වැඩිදියුණු කර ගැනීමටත් 2002 වසරේදී රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව නැවත පිහිටුවන ලදී. දැනට ශ්‍රී ලංකාවේ රාජ්‍ය ව්‍යවසායන් 250 ක් පමණ ඇති අතර ඉන් සියයට 55 ක් පමණ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයට යටත් වන අතර ඉතිරි සියයට 45 ප්‍රමාණය සම්පූර්ණයෙන්ම රාජ්‍ය අයවැය ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක බැවින් ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයට යටත්වන රාජ්‍ය ව්‍යවසායන්ගෙන් වාණිජ ක්‍රියාකාරකම්හි නිරත වන ආයතන 55 ක් උපාය මාර්ගික රාජ්‍ය වාණිජ ව්‍යවසායන් ලෙස හඳුනාගෙන ඇත.එම රාජ්‍ය වාණිජ ව්‍යවසායන්ගේ වත්කම් 2013 දී රු.බිලියන 5,096 සිට 2014 දෙසැම්බර් 31 වන විට රු.බිලියන 5,603 ක් දක්වා සියයට 10 කින් වර්ධනය කරගෙන ඇත.මෙම රාජ්‍ය වාණිජ ව්‍යවසායන් 55 සතු සම්පූර්ණ වත්කම් පදනමින් සියයට 89.1ක් එනම් බිලියන 4,994 ක් සඳහා දායකත්වය දරා ඇත්තේ උපාය මාර්ගික වශයෙන් වැදගත් ප්‍රධාන ව්‍යාපාර 10 වන ශ්‍රීලංකා වරාය අධිකාරිය, ගුවන් තොටුපල හා ගුවන් සේවා සමාගම, ශ්‍රී ලංකා එයාර්ලයින් සමාගම, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා විදුලිබල මණ්ඩලය, ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරිකිරීමේ බැංකුව හා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවයි.

## 2. 2014 කාලපරිච්ඡේදය තුල රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් ඉටු කල ප්‍රධාන කාර්යයන්

අ) චක්‍රලේඛ නිකුත් කිරීම සහ මාර්ගෝපදේශ සංග්‍රහය සඳහා සංශෝධන

රාජ්‍ය ව්‍යවසායයන්ගේ යහපාලනය හා මූල්‍ය විනය තහවුරු කිරීම සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව අඛණ්ඩව රාජ්‍ය ව්‍යවසායයන්හි මෙහෙයුම් හා මූල්‍ය කළමණාකරණයට අදාලව චක්‍රලේඛ/මාර්ගෝපදේශ සංවර්ධනය කිරීමේ හා නිකුත්කිරීමේ කටයුතු වල නිරත විය. 2014 වසර තුලදී, 2003 වසරේ දී නිකුත් කරන ලද මාර්ගෝපදේශ සංග්‍රහය සඳහා සංශෝධන සිදු කෙරිණි. වාණිජ සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රජය සතු සමාගම් වල සේවයේ නියුතු නිලධාරීන් සඳහා සන්නිවේදන පහසුකම් සහ ප්‍රවාහන දීමනා වලට අදාළ චක්‍රලේඛ 2 ක් සඳහා සංශෝධන කෙටුම්පත් අවසන් කෙරිණි.

ආ) පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර කාරක සභා (කෝප්) රැස්වීම් සඳහා සහය ලබා දීම

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර කාරක සභාවේ (කෝප්) විමර්ශන සඳහා, එක් එක් රජය සතු ව්‍යවසායන්හි කාරක සභා රැස්වීම් සඳහා ඒවායේ විස්තරාත්මක වාර්තාවන් සපයමින් අනුග්‍රහය දක්වන ලදී. වැඩි දුරටත්, රාජ්‍ය ව්‍යවසායන් සඳහා කෝප් කමිටුව විසින් දෙන ලද උපදෙස් හා නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳව පසු විපරම් කර නැවත කෝප් කමිටුව වෙත වාර්තා කිරීමට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව සහභාගි වූ කෝප් කමිටු රැස්වීමේ ලැයිස්තුවක් ඇමුණුම I හි දක්වා ඇත.

ඇ) රජය සතු ව්‍යවසායන්හි වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම පිළිබඳ නිරීක්ෂණය කළ අතර එහි වර්තමාන තත්වය ඇමුණුම II හි දක්වා ඇත.

ඈ) රාජ්‍ය ව්‍යවසායන්හි මූල්‍ය ප්‍රකාශය පිළිබඳ විගණකාධිපති විසින් සකස් කළ වාර්තාවන්හි සොයා ගැනීම් පිළිබඳ පසු විවරණයන් සිදු කරන ලදී.

ඉ) පොදු ව්‍යවසායන්හි වාර්ෂික සමුළු/කොටස් හිමියන්ගේ රැස්වීම් සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහභාගි වූ අතර රජයේ ප්‍රතිපත්ති අනුව යමින් එම ව්‍යාපාරයන්ගේ කාර්යය සාධනය වැඩිදියුණු කර ගැනීම සඳහා මාර්ගෝපදේශකත්වය ලබා දෙන ලදී.

ඊ) සියලුම පොදු ව්‍යාපාරයන්හි යහපාලනය පවත්වාගෙන යාමේ අරමුණින් සමාගම් පනතට යටත් වන රාජ්‍ය සමාගම් සඳහා විගණකාධිපතිගේ නිර්දේශ සහිතව බාහිර විගණන ආයතන පත් කිරීම සිදුකරනු ලබයි.

උ) මූල්‍ය පනත, මූල්‍ය රෙගුලාසි හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයන්ට අනුකූලව රාජ්‍ය ව්‍යවසායන් විසින් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයෙන් ලබා ගත යුතු නිර්දේශ ලබා ගැනීම පිළිබඳ සම්බන්ධීකරණ කටයුතු අවශ්‍යතාවය පරිදි රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. තවද, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය ව්‍යවසායන් මඟින් සිදු කරනු ලබන විවිධ ඉල්ලීම් පිළිබඳව විශ්ලේෂණ කර රජයේ ප්‍රතිපත්තීන්ට ඇති අනුකූලතාවය සැලකිල්ලට ගෙන මුදල් අමාත්‍යාංශය වෙත නිර්දේශ ඉදිරිපත් කරන ලදී. මේ යටතේ ප්‍රාග්ධන වියදම්, ණය සීමා වැඩිකර ගැනීම්, තීරු බදු සංශෝධන ආදීන් සඳහා අනුමැතිය ලබාදීම් ඇතුලත් වේ.

ඍ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව සඳහා මාර්ගෝපදේශ හා චක්‍රලේඛ මඟින් ලබා දී ඇති අධිකාරී බලය උපයෝගී කර ගනිමින් රාජ්‍ය ව්‍යවසායන් සඳහා වාහන මිලදී ගැනීම්, විදේශ සංචාර, අයවැය ප්‍රතිපාදන හා මුදල් නිදහස් කිරීම් යනාදිය සඳහා අනුමැතීන් ලබා දෙන ලදී.

එ) රාජ්‍ය ව්‍යවසායන් සම්බන්ධයෙන් බලපවත්නා මාර්ගෝපදේශ හා නීති ප්‍රතිපාදන පිලිබඳ පැහැදිලි කිරීම් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් අවශ්‍යතා පරිදි රාජ්‍ය ව්‍යවසායන් වෙත ලබා දෙන ලදී.

ඒ) පනත් හා ආඥා පනත් සංශෝධන සඳහා නිරීක්ෂණ හා සාකච්ඡා සිදු කිරීමට පහසුකම් සලසා දෙන ලදී. කාර්ය සාධනය හා යහපාලනය වැඩිදියුණු කර ගැනීම සඳහා ලංකා බැංකු ආඥා පනත සංශෝධනය සිදු කරන ලදී.

ඔ) රාජ්‍ය ව්‍යවසායන්හි ප්‍රගති සමාලෝචන, කාර්ය සාධනය හා මෙහෙයුම් ගැටළු විසඳීමට අදාල සාකච්ඡා සඳහා ඒවායේ අධ්‍යක්ෂ මණ්ඩල/ ඉහල කළමනාකාරීත්වය සමඟ භාණ්ඩාගාර ලේකම්තුමා, භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරු හා/හෝ අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ ප්‍රධානත්වයෙන් රැස්වීම් ගණනාවක් සංවිධානය කරන ලදී.

ඕ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ විෂය පථයට අයත් වන රජය සතු ව්‍යවසායන් සම්බන්ධයෙන් ඉදිරිපත් වන අමාත්‍ය මණ්ඩල සංදේශ අධ්‍යයනය හා විශ්ලේෂණ සිදු කර ඒ සඳහා මුදල් අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කළ යුතු නිර්දේශ ඉදිරිපත් කිරීම් කරන ලද අතර ඒ පිලිබඳ විස්තර පහත දක්වා ඇත.

වගුව 1 : රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල නිරීක්ෂණ:

| අංශය | අමාත්‍ය මණ්ඩල නිරීක්ෂණ ප්‍රමාණය |
|---|---|
| බලශක්තිය | 59 |
| වරාය | 11 |
| ගුවන් සේවා | 11 |
| මගී ප්‍රවාහනය | 7 |
| ඉදිකිරීම් | 5 |
| පශු සම්පත් | 2 |
| වැවිලි | 12 |
| පුනර්ජනනීය නොවන සම්පත් | 8 |
| සෞඛ්‍ය | 4 |
| මාධ්‍ය | 8 |
| වෙළෙඳපොළ හා බෙදාහැරීම් | 13 |
| ප්‍රතිව්‍යුහගතකරණය | 41 |
| එකතුව | **174** |

ක)	ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවේ සාමූහික ගිවිසුම් සාකච්ඡා කිරීම සඳහා පත් කල කමිටුව වෙත රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් උපදෙස් සපයන ලදී.

ග)	රාජ්‍ය ව්‍යවසායන් විසින් ලබා දිය යුතු බදු හා ලාභාංශ මුදල් අමාත්‍යාංශය වෙනුවෙන් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් එකතු කරන ලදී. තවද 2014 වසරේ ආදායම් ගිණුම රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලදී.

ජ)	රාජ්‍ය ආයෝජන ගිණුම සංසන්දනය කිරීමේ කටයුතු රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් 2014 වසරේදී ආරම්භ කළ අතර ඊට අදාල තොරතුරු රාජ්‍ය ව්‍යවසායන්ගෙන් හා ඒවායේ උප සමාගම් වලින් රැස් කරමින් පවතී.

## 3. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයට යටත් වන රාජ්‍ය ව්‍යවසායන්හි භෞතික කාර්යයසාධනය.

### 3.1 මහා භාණ්ඩාගාරයට ගෙවන අයභාර හා ලාභාංශ

2012, 2013 සහ 2014 යන වර්ෂයන්හිදී, පිළිවෙලින් රජය සතු ව්‍යවසායන් 37 ක්, 43 ක් සහ 41 ක් මඟින් රජයේ බදු නොවන ආදායම් ලෙස රු. බිලියන 47, 35 සහ 47 ක මුදලක් රජයේ ඒකාබද්ධ අරමුදලට ලාභාංශ හා අයභාර ලෙස බැරකර ඇත. අතීත වාර්තා වලට අනුව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරිකිරීමේ බැංකුව සහ ජාතික රක්ෂණ භාරකාර අරමුදල යන ආයතනයන් ප්‍රධාන වශයෙන් ඒකාබද්ධ අරමුදලට දායකත්වයක් ලබාදී ඇත. ඒ අනුව, 2014 වර්ෂයේදී රාජ්‍ය බැංකු, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව යන ආයතනයන් පිළිවෙලින් සියයට 37 ක්, 21 සහ 21 ක් වශයෙන් ලාභාංශ හා අයභාර වශයෙන් මහා භාණ්ඩාගාරයට ලබාදී ඇත.

කෙසේ වුවත්, විශාල රාජ්‍ය ව්‍යවසායන් වන ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් සිදු කරන මහා පරිමාණ ප්‍රාග්ධන ව්‍යාපෘති හේතුවෙන්ද, ලංකා විදුලි බල මණ්ඩලය සහ ශ්‍රී ලංකන් ගුවන් සමාගම සහ සැලකිය යුතු ලෙස අලාභ ලැබීම හේතුවෙන් ද මෙම වසරේදී මහා භාණ්ඩාගාරය වෙත ලාභාංශ හා අයභාර ලබා දී නොමැත. 2014 වර්ෂයේදී රජය වෙත ලාභාංශ හා අයභාර ලැබීම පිළිබඳ තොරතුරු අංක III ඇමුණුමෙහි දක්වා ඇත.

### 3.2 රාජ්‍ය ව්‍යවසායන්හි සේවා නියුක්තිය

රජය සතු ව්‍යවසායන්හි පුද්ගලයන් 261,683 කින් පමණ සමන්විත වූ ශක්තිමත් ශ්‍රම බලකායක් සේවය කල අතර 2013 වසර සමඟ සංසන්දනයේදී 2014 වසරේදී ශ්‍රම බලකාය සියයට 2.1 කින් වැඩි වී ඇත.

### 3.3 රාජ්‍ය ව්‍යවසායයන්සඳහා අයවැය ප්‍රතිපාදන

2014 වර්ෂයේදී මහා භාණ්ඩාගාරය විසින් රජය සතු ව්‍යවසායයන් 30 ක් සඳහා රු. බිලියන 126 ක් ද, 2013 වර්ෂයේදී ව්‍යවසායයන් 33 ක් සඳහා රු. බිලියන 67 ක් ද වශයෙන් අයවැය ප්‍රතිපාදන ලබාදී ඇත. ඒ අනුව, පසුගිය වර්ෂය හා සසඳා බැලීමේදී සියයට 303 ක අයවැය ප්‍රතිපාදන ලබාදීමෙහි වැඩිවීමක් දක්නට ලැබෙන අතර එම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ රජය සතු අනෙකුත් රාජ්‍ය ව්‍යවසායයන් උපාය මාර්ගිකව නගා සිටුවීමට ආයතනයන්ගේ ශේෂපත්‍ර ශක්තිමත් කිරීම තුලින් එම ශක්තිමත් ශේෂපත්‍ර මත සංවර්ධන හවුල්කරුවන්ගේ සහ වෙළෙඳපොල මූලාශ්‍ර මඟින් අරමුදල් සපයා ගැනීම වේ. රාජ්‍ය ව්‍යවසායයන් සඳහා ලබාදුන් අයවැය සහන ඇමුණුම IV හි දක්වා ඇත.

### 3.4 ක්‍රමෝපායයන් වශයෙන් වැදගත්වන රාජ්‍ය ව්‍යවසායන්හි මූල්‍ය තත්ත්වය

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් කලින් කල රාජ්‍ය ව්‍යවසායන්හි මූල්‍ය තොරතුරු එක්රැස් කර විශ්ලේෂණය කරන අතර එහි ප්‍රතිඵල අනුව අධ්‍යක්ෂ මණ්ඩල හා කළමනාකාරිත්වය සමඟ සමාලෝචන සාකච්ඡා පැවැත්වේ. ක්‍රමෝපායික වශයෙන් වැදගත්වන රජය සතු ව්‍යවසායන්හි මූල්‍ය තත්වය ඇමුණුම V හි දක්වා ඇත.

## 4. රාජ්‍ය ව්‍යවසායන්හි කාර්යසාධනය වැඩිදියුණු කිරීම සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ දායකත්වය

### 4.1 රාජ්‍ය ව්‍යවසායන්ගේ කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග හා නිර්දේශයන්

රාජ්‍ය ව්‍යවසායන්හි කෙටිකාලීන හා මධ්‍ය කාලීන අරමුණු ලඟා කර ගැනීම සහතික කිරීම සඳහා පහත දැක්වෙන නිර්දේශ ඉදිරිපත් කර ඇත.

| අංශය | රාජ්‍ය ව්‍යවසායන්ගේ කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග | නිර්දේශයන් |
|---|---|---|
| බලශක්තිය<br><br>ලංකා විදුලිබල මණ්ඩලය හා ලංකා ඛනිජ තෙල් | 2014 වර්ෂය තුළ ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව සිය පිරිපහදුව ක්‍රියාත්මක කරවීම, බොරතෙල් ආනයනය කිරීම සහ ඩීසල්, පෙට්‍රල්, භූමිතෙල්, දැවිතෙල් සහ ගුවන්යානා ගෑස් ඇතුළු පිරිපහදු කරන ලද නිෂ්පාදන අලෙවි කිරීමේ කාර්යයෙහි නියැලී සිටී. 2014 වර්ෂය තුළ මෙරටට ආනයනය කරන ලද ඛනිජතෙල් හා ආශ්‍රිත නිෂ්පාදනයන්ගේ වටිනාකම ඇ.ඩො. මිලියන 4000 ක් වූ අතර එය රටෙහි සමස්ත ආනයන ප්‍රමාණයෙන් හතරෙන් පංගුවක් පමණ නියෝජනය කරමින් රජයේ බදු ආදායමට සියයට 5.5 ක පමණ දායකත්වයක් සැපයීය.<br><br>ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව ඛනිජ තෙල් ක්ෂේත්‍රයෙහි ප්‍රධාන සැපයුම්කරු ලෙස සියයට 80 ක | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ඛනිජ තෙල් සැපයීමේ නිරත වන සුළු රටවල් ප්‍රමාණයක් මත යැපීමට වඩා බොරතෙල් සැපයීමේ නිරතවන ආර්ථිකමය වශයෙන් ජීවගුණයෙන් යුතු විකල්ප සැපයුම් කරුවන් පිළිබඳ ගවේශනය කිරීම අවශ්‍ය වී තිබේ. දශක ගණනාවක් පැරණි සහ එමගින් ඇති වී ඇති අකාර්යක්ෂමතාව යන කරුණු දෙකම හේතුවෙන් ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පිරිපහදුව නවීකරණය කිරීම සහ පැරණි නල පද්ධතිය අළුත් වැඩියා කිරීම අත්‍යවශ්‍ය කටයුත්තක් වී ඇත.<br><br>එසේම ඛනිජ තෙල් නීති ගත සංස්ථාවේ ශේෂපත්‍රය, හිමිකම් ප්‍රාග්ධනය ඉහළ දැමීමක් මගින් |

| | | |
|---|---|---|
| නීතිගත සංස්ථාව | වෙළෙඳපොළ කොටසකට හිමිකම් කියනු ලබන අතර ලිහිසි තෙල් කර්මාන්තයේ තුන්වන විශාලතම සැපයුම්කරුවාද වේ. බොහෝමයක් ඛනිජතෙල් හා ආශ්‍රිත නිෂ්පාදනයන් සඳහා 2013 වර්ෂයේ පෙබරවාරි මස සිට ක්‍රියාත්මක කරනු ලැබූ පිරිවැය පිළිබිඹු වන මිල ක්‍රමය තවදුරටත් පවත්වාගෙන යාමත් ජාත්‍යන්තර වෙළෙඳපොලේ ඛනිජතෙල් මිල ගණන් පහත බැසීමත් හේතු කරගෙන 2008 වර්ෂයේ සිට ඛනිජතෙල් නීතිගත සංස්ථාව අත්කරගෙන තිබූ මෙහෙයුම් අලාභය 2014 වර්ෂයේදී රු. බිලියන 1.6 ක මෙහෙයුම් ලාභයක් බවට පත්කර ගැනීමට හැකියාව ලැබිණි. තවදුරටත්, 2014 වර්ෂයේදී බොරතෙල් බැරලයක සාමාන්‍ය මිල ඇ.ඩො. 98 ක් දක්වා පහත වැටුණි. | හෝ තිරසරාත්මක මෙහෙයුම් ලාභ උපරිම කිරීමක් මගින් ශක්තිමත් කිරීම අවශ්‍ය වේ. මෙහිදී ලංකා ඛනිජ තෙල් නීති ගත සංස්ථාව වසින් රේඛීය අමාත්‍යාංශයේ හා මුදල් අමාත්‍යාංශයේ ද සහය ඇතිව වඩාත් නව්‍යාත්මක මූල්‍ය මාර්ග කෙරෙහි අවධානය යොමුකල යුතු වේ. එමගින් වඩා ඵලදායී ප්‍රමාණවත් වාසි ළගා කර ගැනීම සඳහා යටිතල පහසුකම් සංවර්ධනය උදෙසා වන අයෝජන ශක්තිමත් කිරීමටද උත්සාහ ගත යුතු වේ. |
| | 2014 වර්ෂයේ අයවැය යෝජනා වල සඳහන් පරිදි ලංකා විදුලි බල මණ්ඩලයේ සහ අනෙකුත් රජයේ දෙපාර්තමේන්තු විසින් ඛනිජ තෙල් සංස්ථාවට පියවිය යුතු දීර්ඝ කාලීන ණය මුදල් ගෙවීම සඳහා භාණ්ඩාගාරය විසින් රු. බිලියන 30.69 වටිනා භාණ්ඩාගාර බැදුම්කර 2014 වර්ෂයේ පෙබරවාරි මස ඛනිජ තෙල් සංස්ථාවට නිකුත් කිරීමට කටයුතු කළ අතර ආනයනික ඛනිජ තෙල් හා ආශ්‍රිත නිෂ්පාදන සඳහා ගෙවිය යුතු බදු සහ අය බදු භාරය භූමිතෙල් සහනාධාරය යටතේ කපා හරින ලදී. | ලංවිම විසින් තම අනාගත ආයෝජන සඳහා අවශ්‍ය ණය මූලාශ්‍ර ස්වාධීනව සකසා ගත යුතු අතර එම වගකීම් සපුරාලීම සඳහා අවශ්‍ය මූල්‍ය සැලසුම් සම්පාදනය කර ගත යුතු බවට උපදෙස් දී ඇත.<br><br>ලංවිමට ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව විසින් ලබාදී ඇති ණය සීමාවන්ට තරයේම අනුගත විය යුතු අතර තවදුරටත් අනුමත සීමාව තුළ බැංකු ණය කළමනාකරණය කරගත යුතු බවට උපදෙස් දී ඇත. |
| | එසේම ශ්‍රී ලංකන් ගුවන් සමාගම සහ මිහින් ලංකා ආයතනයන් නැවත ප්‍රාග්ධනිත කිරීමේ වැඩ පිළිවෙල යටතේ රු. බිලියන 26.11 ක් වටිනා භාණ්ඩාගාර බැදුම්කර ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත නිකුත් කරමින් එම ආයතන දෙක විසින් සංස්ථාවට ගෙවිය යුතුව තිබූ මුදල් පියවා දැමීමටද 2014 වර්ෂයේ පළමු කාර්තුව තුලදී හැකියාව ලැබිණි. | මෙම සාමූහික ගිවිසුම ක්‍රියාත්මක කිරීමේදී සේවක අයිතිවාසිකම් සුරක්ෂිත කරන අතරම ශ්‍රම ඵලදායකත්වය ඉහළ නැංවීම තුළින් ලංවිමෙහි මෙහෙයුම් කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමෙහිලා එම ගිවිසුමට අදාළ සියළු පාර්ශවයන් ඔවුන්ගේ යුතුකම් ඉටුකිරීමට බැඳී සිටිය යුතුව ඇත. එමෙන්ම උපයන විට ගෙවීම් බදු ඍජුවම සේවකයන්ගේ වැටුපෙන් අයකර ගැනීම සඳහා ලංවිම විසින් තවදුරටත් ක්‍රියාමාර්ග ගතයුතු බවට උපදෙස් දී ඇත |
| | 2013 දී ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණයත් සමඟ ලංවිමෙහි ශේෂපත්‍රය ශක්තිමත් කර ස්වාධීනව තම මෙහෙයුම් කටයුතු කරගෙන යාමේ අරමුණින් මහා භාණ්ඩාගාරය විසින් ලංවිමට ලබා දී තිබූ රු. බිලියන 162 ක් වූ ප්‍රතිණය ලංවිමෙහි හිමිකම (ස්කන්ධ ප්‍රාග්ධනය) බවට පත් කරන ලදී. තවදුරටත්, 2014 වර්ෂය තුළදී කරන ලද ප්‍රතිණය එහි හිමිකම බවට පරිවර්තනය කිරිම සඳහා අවශ්‍ය අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගන්නා ලදී. | |
| | ලංවිම විසින් ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවට ගෙවිය යුතු පොළිය වෙනුවෙන් රු. බිලියන 8.5 ක වටිනාකමකින් යුතු භාණ්ඩාගාර බැඳුම්කරයක් නිකුත් කරන ලදී. | |
| | ලංවිමෙහි කළමනාකාරිත්වය සහ අදාළ වෘත්තීය සමිති අතර සාමූහික ගිවිසුම ස්ථාපිත කිරීමට මඟ පෙන්වීම. | |

| | | |
|---|---|---|
| ජලය<br><br>ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | ජල සම්පාදන හා මළාපවහන පහසුකම් සැපයීමේ ප්‍රමුඛයා ලෙස 2014 වසරේදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් රු.මිලියන 35,668 ක් ජල සම්පාදන ක්ෂේත්‍රය සඳහා ආයෝජනය කර ඇති අතර එම වසර තුළ ආරම්භ කරන ලද ප්‍රධාන ව්‍යාපෘති පහත දැක්වේ.<br><br>බදුල්ල - හාලිඇල සහ ඇල්ල ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය<br><br>කුරුණෑගල ජල සම්පාදන හා මළාපවහන ව්‍යාපෘතිය<br><br>2014 වසරේදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයවිසින් පානීය ජලය ඝන මීටර මිලියන 575 ක් රු. මිලියන 17,431 ක පුනරාවර්තන වියදමක් දරමින් නිෂ්පාදනය කර ඇති අතර එය 2013 වසර හා සැසඳීමේදී සියයට 5.1 ක වර්ධනයකි. 2013 වසරේදී රු. 45.35 ක් වූ ජලය ඝන මීටරයක සාමාන්‍ය පිරිවැය 2014 වසරේදී රු.44 දක්වා අඩු වී ඇත.<br><br>ජල නිෂ්පාදනය ඉහළ යාම හේතුවෙන් පෙර වසරට සාපේක්ෂව 2014 වසරේදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ආදායම සියයට 8.7කින් වර්ධනය වී ඇති අතර එම නිසා මණ්ඩලයේ ලාභය රු.මිලියන 1,432 දක්වා සියයට 20කින් ඉහළ ගොස් ඇත.<br><br>ජල සම්පාදන ක්ෂේත්‍රය පුළුල් කිරීමට අවශ්‍ය ආයෝජන ඔවුන්ටම ස්වාධීන වූ මූල්‍යන මාර්ග තුළින් සපයා ගැනීමට අවශ්‍ය පසුබිම සකස් කරදීම උදෙසා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ශේෂ පත්‍රය සවිබල ගැන්වීමට පියවර ගෙන ඇත. | වකුගඩු රෝගය වළක්වාගැනීම සඳහා එම ගැටළුව පවතින ප්‍රදේශවලට පානීය ජලය සැපයීමේ ජාතික මට්ටමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ප්‍රමුඛතාවය දීම.<br><br>පිරිවැය ඉහළ යාම හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වීම අවම කරගැනීම සඳහා ක්‍රමවේද සකස් කිරීම.<br><br>ආදායම් නොලබන ජල ප්‍රතිශතය අඩුකිරීම සඳහා ජාතික මට්ටමේ උපාය මාර්ග සකස් කිරීම<br><br>ජල සම්පාදනය සඳහා පෞද්ගලික ආයෝජන දිරි ගැන්වීම.<br><br>ප්‍රජාමූල සංවිධාන විසින් බෙදාහරින ජලයේ ගුණාත්මක බව තහවුරු කිරීම.<br><br>ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ බලශක්තිය සඳහා වන පිරිවැය අඩුකිරීම උදෙසා පිරිවැය කාර්යක්ෂමතාවය දියුණුවන පරිදි සුදුසු තාක්ෂණික ක්‍රම භාවිතය.<br><br>ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය තුළ කාර්යක්ෂම තොග කළමණාකරණ පද්ධතියක් පිහිටුවීම.<br><br>පාරිභෝගිකයන්ට පහසුවෙන් ජල සම්පාදනහා මළාපවහන සම්බන්ධතා ලබා ගැනීමට හැකි වැඩ පිළිවෙළක් සකස් කිරීම. |
| මගී ප්‍රවාහනය<br><br>ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය | 2014 සිට 2018 කාලය තුල ණය සැපයීමේ පදනම මත වන බස් රථ 2,200 ක් මිලට ගැනීමෙන් පවතින බස් රථ ඇණිය ශක්තිමත් කිරීම සඳහා රජය විසින් රු බිලියන පහක් ඇස්තමේන්තු කර වෙන් කර ඇත. ශ්‍රීලංගම සේවකයන්ගේ හිඟව ඇති සියළුම සේවක අර්ථසාධක අරමුදල්, සේවක භාරකාර අරමුදල් හා පාරිතෝෂික මුදල් ගෙවා නිම කරන ලෙසට උපදෙස් ලබා දී ඇත. | සුදුසු මෙහෙයුම් කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම තුලින් මෙහෙයුම් කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම.<br>ධාවන තත්ත්වයේ නොමැති බස්රථ අපහරණය කිරීම.<br>සේවකයින්ගේ ව්‍යවස්ථාපිත ගෙවීම මාසිකව නියමිත දිනට බැර කරමින් සේවක අර්ථසාධක අරමුදල් සේවක භාරකාර අරමුදල් හා පාරිතෝෂික මුදල් යනාදියෙහි හිඟ ව්‍යවස්ථාපිත හිමිකම් ගෙවීමට කඩිනම් පියවර ගැනීම.<br>සුදුසු අභ්‍යන්තර පරිපාලන විධික්‍රම ක්‍රියාත්මක කරමින් ඉන්ධන භාවිතයේ පවතින අකාර්යක්ෂමතා හා කාන්දුවීම් අවම කිරීම. |
| ගුවන් සේවා | ශ්‍රී ලංකන් ගුවන් සේවය සඳහා කරන ලද සුවිශේෂි යටිතල පහසුකම් ආයෝජනයන් හේතුවෙන් රටේ ගුවන් සේවා ක්ෂේත්‍රයේ වර්ධනය සඳහා දායකත්වයක් දක්වා ඇත. | පසුගිය වසර කිහිපය තුළ ශ්‍රී ලංකන් ගුවන් සමාගම සහ මිහින් ලංකා ගුවන් සමාගම ලබා ඇති විශාල අලාභය නිසා දින 100 විප්ලවීය වැඩසටහන යටතේ එක් විසඳුමක් ලෙස මෙම ආයතන දෙක ඒකාබද්ධ කිරීමට තීරණය කරන ලද අතර සම්පත් කාර්යක්ෂමව යෙදවීමත් මෙහෙයුම් කාර්යක්ෂමතාවය ක්‍රමයෙන් වැඩි කිරීමත් තුළින් ඉදිරි අලාභය ක්‍රමානුකූලව අඩු කර ගැනීමට අපේක්ෂා කෙරේ. |

| | | |
|---|---|---|
| ගුවන් තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම | ගුවන් තොටුපල හා ගුවන් සේවා සමාගම මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපල ඉදි කිරීම් සඳහා ලබා ගත් ඇ ඩො මිලියන 190 ක ණය මුදල ආපසු ගෙවීම සමාගමට පැවරීම සඳහා පහසුකම් සලසා ඇත. | බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලෙහි ගුවන් බඩු පරිහරණය කිරීමේ ප්‍රමාණය වැඩි කිරීම<br>2016 වසර වන විට ගුවන් මගීන් මිලියන 12 කට වැඩි පිරිසකට අවශ්‍ය පහසුකම් සැපයීම සඳහා බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල නවීකරණය කිරීම හා එහි ධාරිතාව වැඩි කිරීම |
| ශ්‍රී ලංකන් ගුවන් සමාගම | ගුවන් යානා ඇණි ශක්තිමත් කිරිම හා කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා සම්මේලික (සින්ඩිකේටඩ්) ණය පහසුකම හා ජාත්‍යන්තර බැඳුම්කර මගින් වූ අරමුදල් රැස් කිරීම තුළින් ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ ද්‍රවශිලතා ගැටළු සැහැල්ලු කර ගැනීමට පහසුකම් සලසනු ලැබීය. එමගින් ආදායම වැඩි කර ගැනීමෙන් හා පිරිවැය අඩු කරගැනීමෙන් ශ්‍රී ලංකන් ගුවන් සමාගමට මෙම වසර තුළ අලාභය අඩුකර ගැනීමට හැකියාව ලැබුණි. | වැඩි වන ගුවන් මගීන්ගේ හා නැව් බඩු ප්‍රවාහනය හා අවශ්‍යතාවය සපුරාලීම සඳහා මධ්‍ය කාලය තුළ ගුවන් යානා ඇණි පුළුල් කිරීම<br>මෙහෙයුම් වලදී සැලකිය යුතු පිරිවැය කාර්යක්ෂමතාවයක් ඇති කිරීම<br>නවතම මගීන්ගේ සැප පහසුව සහ මෙහෙයුම් කාර්යක්ෂමතාවය වඩ් දියුණු කිරීමට පවතින යානා ප්‍රති ඇණිගත කිරීම<br>ආදායම වැඩි දියුණු කිරීමට උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම |
| මිහින් ලංකා (පුද්) සමාගම | පිරිවැය අඩු කිරීමට හා භාණ්ඩාගාර අරමුදල් භාවිතයෙන් සමාගම ලාභ පාඩු නොලබන තත්ත්වයට පත් කිරීම සඳහා අවශ්‍ය සියලුම පියවරයන් ගැනීමට උපදෙස් ලබා දීම<br>අලාභය අඩු කිරීමට හැකියාව ලැබී ඇත. | ගමනාන්තයන් අතර පවතින ජාලා සම්බන්ධතාවය පුළුල් කිරීම |
| වරාය | වාහන ප්‍රතිඅපනයන කටයුතු හා නැව් සඳහා ඉන්ධන සැපයීමේ කටයුතු පුළුල්කිරීමේ හා දිරිගැන්වීමේ අරමුණින්, මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය සඳහා නව ප්‍රවර්ධන බඳු අනුපාතයන් ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් හඳුන්වා දෙනු ලැබීය. තවද, වියදම් ආවරණය කරගැනීම හා නව සේවා හඳුන්වා දීමේ අරමුණ ඇතිව වරාය අධිකාරිය විසින් කොළඹ වරායේ බඳු අනුපාතයන් සංශෝධනය කරන ලදි.<br><br>ඉතා විශාල බහාලුම් ධාරිතාවන් සහිත නෞකා හැසිරවීම සඳහා ඉදිවන නැගෙනහිර බහාලුම් පර්යන්තය 2015 වසරේදී වරාය අධිකාරිය යටතේ මෙහෙයුම් ආරම්භ කිරීමට නියමිතය.<br>2014 වර්ෂය අවසන් වන විට වරාය සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් රු. බිලියන 206 ක් දක්වා විදේශීය අරමුදල්ද රු. බිලියන 11.9 ක් දක්වා දේශීය ණයද ලබා ගැනීම සඳහා වරාය අධිකාරිය වෙත පහසුකම් සලසා දී ඇත. | වරාය අධිකාරියේ සමස්ත ණය වගකීම් ප්‍රමාණය එහි සමස්ත වත්කම් වලින් සියයට 66 ක් නියෝජනය වන බැවින්, ක්‍රමවත් ණය ස්ථායීකරණයක් සඳහා යෝග්‍ය ණය කළමනාකරණ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම සුදුසුය.<br><br>වර්ධනය කරන ලද යටිතල පහසුකම් හා අනෙකුත් සේවා පහසුකම් මගින් ආයතනයේ ඵලදායීතාව හා මෙහෙයුම් ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම හරහා වරාය අධිකාරියේ සමස්ත පිරිවැටුම් ඉහළ නැංවීමට සුදුසු ක්‍රියාමාර්ගයන් ගත යුතුය.<br><br>පිරිවැටුම් ඉහළ දැමීමේ ක්‍රමවේදයක් වශයෙන් වරාය අධිකාරිය මගින් බාහිර පාර්ශවයන් වෙත පවරා ඇති වාණිජ වටිනාකමකින් යුත් ඉඩම් වල බදු ගිවිසුම් සංශෝධනය කිරීම සහ එම ගිවිසුම් වෙළෙඳපොළ තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් කාලීනව යාවත්කාලීන කිරීම සුදුසු බව යෝජනා කෙරේ. |

| | | |
|---|---|---|
| ඉදිකිරීම් | රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ පොදු කාරක සභාවේදී මහා භාණ්ඩාගාරයේ ලේකම් නියෝජනය කළ අතර මිල ගණන් අනුමත කිරීමේ කමිටුවේ ප්‍රමාද වීම් හා හිඟ ණය මුදල් සම්බන්ධයෙන් එම කාරක සභාව විසින් ලබා දුන් මග පෙන්වීම් සම්බන්ධයෙන් පසු විපරම් කිරීම සිදු කිරීම.<br><br>මෙම දෙපාර්තමේන්තුවේ අඛණ්ඩව සුපරීක්ෂණය හා සිහි කැඳවීම් ලිපි යැවීමේ ප්‍රතිඵලයක් ලෙස ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය, රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව,රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව යන ආයතනයන්හි 2011 දක්වා වූ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට හැකියාව ලැබිණි.අනෙකුත් වාර්ෂික වාර්තා ප්‍රමාද වීමකින් තොරව අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම සඳහා අවශ්‍ය උපදෙස් එම ආයතනවලට ලබා දී ඇත. | ඉදිකිරීම් භාර ගැනීම ආයතනයේ ධාරිතාවයට පමණක් සීමා කිරීම.<br><br>මෙම ආයතන නව ප්‍රමිතීන්, තාක්ෂණය හා සංකල්ප වලින් වැඩි දියුණු කිරීම.<br><br>විශාල ව්‍යාපෘති හැසිරවිය හැකි විශිෂ්ට නිපුනතාවයකින් යුතු සේවකයන් යොදවා ගැනීම.<br><br>ව්‍යාපෘති භාර ගැනීමට පෙර ඒ සඳහා වන අයවැය ප්‍රතිපාදන වෙන් කිරීම තහවුරු කර ගැනීම . |
| රාජ්‍ය බැංකු | රාජ්‍ය බැංකු වල අක්‍රීය වත්කම් අඩු කිරීමේ අරමුණ ඇතිව ලංකා බැංකුව, මහජන බැංකුව සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව ශ්‍රී ලංකන් ගුවන් සමාගමෙන් ලබා ගත් කොටස් භාණ්ඩාගාරය විසින් ආපසු මිලදී ගන්නා ලදී.<br><br>ලංකා බැංකුවෙහි හර ප්‍රාග්ධනය ශක්තිමත් කිරීම සඳහා රජය විසින් රුපියල් බිලියන 5 ක ප්‍රාග්ධන දායකත්වයක් සිදු කරන ලදී.<br><br>ලංකා බැංකුවෙහි සී ෂෙල්ස් ශාඛාවෙහි මෙරටින් යවන ලද මාණ්ඩලික නිලධාරී තනතුරු සඳහා වැටුප් පරිමා අනුමත කිරීම.<br><br>ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවෙහි සාමූහික ගිවිසුම පිළිබඳව කතිකාවක් සඳහා පහසුකම් සැලසීම. | ආර්ථිකයේ මතු වී ගෙන එන අංශ හඳුනා ගැනීම සහ ණය එම අංශ වෙත යොමු කිරීම.<br><br>ණය වල ගුණාත්මක භාවය වර්ධනය කිරීම සඳහා ණය අයකර ගැනීමේ යාන්ත්‍රණය වැඩි දියුණු කිරීම.<br><br>සුළු හා මධ්‍ය පරිමාණයේ ව්‍යවසාය අංශයන්හි අවශ්‍යතාවයන් ඉටු කර ගැනීමට පහසුකම් සැලසීම සඳහා ලංකා බැංකුවේ සහ මහජන බැංකුවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ආයතන වෙනත් තැනක නැවත ස්ථානගත කිරීම.<br><br>කර්මාන්තයේ ප්‍රතිවාදීන් සමඟ තරඟ කිරීම සඳහා තාක්ෂණික හැකියාවන් වැඩි දියුණු කිරීම.<br><br>ව්‍යාපාරය පුළුල් කිරීමේ අරමුණ ඇතිව බැංකුවෙහි අභිවෘද්ධිය වෙනුවෙන් බැංකුවල ප්‍රවර්ධන වියදම් යොමු කිරීම. |
| අලෙවිය හා බෙදාහැරීම් | **හොටෙල් ඩිවලොපර්ස් ලංකා පී.එල්.සී**<br><br>එච්.ඩී.එල් සමාගම විසින් රජයට ගෙවිය යුතුව තිබූ මුදලින් සියයට 80 ක් (රු. බිලියන 10.7) ස්කන්ධ ප්‍රාග්ධනය බවට පරිවර්තනය කරන ලද අතර ප්‍රධාන හෝටලය පිහිටා තිබෙන ඉඩම එච්.ඩී.එල් ආයතනයට දීර්ඝ කාලීන බදු ක්‍රමය යටතේ පවරා එම බදුකරයේ වටිනාකම (රු. බිලියන 7) එහි ස්කන්ධ ප්‍රාග්ධනය ලෙස පරිවර්තනය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස 2013 වසරේදී එච්.ඩී.එල් සමාගමේ රජය සතු කොටස් ප්‍රාග්ධනය රු. බිලියන 17.7 කින් වර්ධනය විය. 2014 වසරේදී රජයට ගෙවීමට ඉතිරිව තිබූ සියයට 20 ක ණය මුදළ (රු. බිලියන 2.35) ස්කන්ධ ප්‍රාග්ධනය බවට පත් කෙරුනේ තවදුරටත් ආයතනයේ ශේෂ පත්‍රය ශක්තිමත් කිරීමේ අරමුණෙනි. ඒ අනුව, වත්මනෙහි එච්.ඩී.එල්. සමාගමේ රජය සතු කොටස් ප්‍රාග්ධන වටිනාකම රු. බිලියන 20.46 ක් වේ. | විවිධ වියදම් තලයන්වලට අයත් දේශීය මෙන්ම විදේශීය සංචාරකයන් ආකර්ෂණය කර ගැනීම සඳහා වන නම්‍යශීලී මිල පැකේජයන් හඳුන්වා දීම.<br><br>සංචාරක සංඛ්‍යාවේ වර්ධනයට සමානුපාතිනව සාම්ප්‍රදායික සංචාරක අත්දැකීම් වලින් බැහැර වෙමින් විවිධත්වයෙන් යුත් නවමු හා අසමසම සංචාරක අත්දැකීම් පිරිනැමීම කෙරෙහිත් අවධානය යොමු කිරීම. |

| | | |
|---|---|---|
| | 2014/15 සහ 2015/16 මූල්‍ය වර්ෂය තුල හිල්ටන් හෝටලය නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය හේතුවෙන් ආදායම සියයට 11 කින් අඩුවී ඇත. | |
| | **ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය**<br><br>ආයතනයේ පිරිවැටුමෙහි සියයට 19 ක වර්ධනයක් පෙන්නුම් කළ ද පරිපාලන වියදම්හි වර්ධනය හේතුවෙන් මුළු වියදම සියයට 20 කින් වර්ධනය වී ඇත. බදු පෙර ලාභය පෙර වසරේ වාර්තාගත අගය වන රු. මිලියන 24 සිට රු. මිලියන 21 ක දක්වා සියයට 13 කින් පහළ බැසීමට හේතු වී ඇති එක් කරුණක් නම් ඇතැම් ලක්සල ප්‍රදර්ශනාගාර සහ අලෙවිසැල් සඳහා ගෙවීමට සිදුවී ඇති ගොඩනැගිලි කුලී ප්‍රමාණයන් ඉහළ අගයක් ගැනීමය.<br><br>2016 වසර සඳහා ඉලක්කගත මිලියන 2.5 ක සංචාරක ආගමනයන් හමුවේ දේශීය තෑගි හා සමරු භාණ්ඩ කර්මාන්තය සඳහා බිහිවන විශාල වෙළෙඳපොල අවස්ථාවන් සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ ප්‍රගමනය සඳහා බෙහෙවින් ඉවහල් වනු ඇත. | සංචාරක කර්මාන්තය වැඩි වශයෙන් ප්‍රචලිත ප්‍රදේශවල වෙළඳ කුටි ඇති කිරීම තුළින් සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනයේ වාසිය උපරිම වශයෙන් ලබා ගැනීමට අවශ්‍ය උපාය මාර්ග සැකසීම. |
| | **සීමාසහිත ලංකා සතොස**<br>නව වෙළෙඳසැල් 16 ක් විවෘත කිරීම හා තෝරාගත් භාණ්ඩ අඩු මිලට සැපයීම හේතුවෙන් 2014 වසරේදී ලංකා සතොස ආයතනයේ විකුණුම් ආදායම සියයට 19 කින් වර්ධනය කරගැනීමට හැකියාව ලැබී ඇත.<br><br>2014 වසරේදී දේශීය වෙළෙඳ පොළ තුළ සහල් හිඟය වළක්වා ගැනීමේ අරමුණෙන් ලංකා සතොස සහල් මෙට්‍රික් ටොන් 235,000ක් ආනයනය කරන ලදී. ඒ සඳහා රු.බිලියන 10 ක බැංකු ණය ලබාගෙන ඇති අතර දැනට රු.බිලියන 7 ක පමණ පියවිය යුතුව ඇති ණය ශේෂයක් පවතී. | වෙළෙඳ පොළ කොටස වර්ධනය කරගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.<br><br>භාණ්ඩ විකිණීමෙන් ලබන ආදායම යොදා ගනිමින් බැංකු ණය පියවීමට පියවර ගැනීම. |
| | **ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව**<br><br>2014 වසරේදී සී/ස රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවේ ආදායම සියයට 34 කින් වර්ධනය වුවද මූල්‍ය පිරිවැය ඉහළ යාම නිසා මුළු වියදම සියයට 36 කින් වර්ධනය වී ඇත. මේ හේතුවෙන් 2014/2015 මූල්‍ය වර්ෂයේ ලාභය සියයට 41 කින් අඩු වී ඇත. | රාජ්‍ය අංශයට පමණක් සීමා නොවී පෞද්ගලික අංශයේ පාරිභෝගිකයන් ද ඉලක්ක කරගැනීම මඟින් වෙළෙඳ පොළ කොටස වර්ධනය කරගැනීමට පියවර ගැනීම.<br><br>තම නිෂ්පාදන වෙළෙඳ පොළ සඳහා යොමු කිරීමට පියවර ගැනීම හා ඒ තුළ සී/ස රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවේ වෙළෙඳ නාමය ප්‍රචලිත කිරීමට පියවර ගැනීම. |
| | **රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව**<br><br>2014 වසරේදී මුළු ආදායම සියයට 8 කින් වර්ධනය වූ අතර විකුණුම් පිරිවැය ඉහළ යාම නිසා සංස්ථාවේ මුළු පිරිවැය සියයට 9 කින් වර්ධනය වී ඇත. මේ හේතුවෙන් බදු පෙර ලාභය සියයට 9 කින් අඩු වී ඇත. | නිෂ්පාදන ධාරිතාවය හා පිරිවැය කාර්යක්ෂමතාවය වර්ධනයකර ගැනීමට අවශ්‍ය ක්‍රමෝපායයන් ක්‍රියාත්මක කිරීම හා එමඟින් තරගකාරී මිලකට භාණ්ඩ සැපයීම.<br>මධ්‍යකාලීනව ලාභදායීත්වය හා වෙළෙඳ පොළ කොටස වර්ධනය කරගැනීමට අවශ්‍ය ක්‍රමෝපායයන් සකස්කර ක්‍රියාත්මක කිරීමට නොපමාව පියවර ගැනීම. |

| | | |
|---|---|---|
| | 2014 වසරේදී කෙටි කාලීන ණය ප්‍රමාණය පෙර වසරට සාපේක්ෂව සියයට 13 කින් වැඩි වීම එළඹෙන වසරවල මූල්‍ය පිරිවැය වර්ධනය වීමට බලපා ඇත. | |
| | **රාජ්‍ය දැව සංස්ථාව**<br>අඩි 5,000 ට වඩා වැඩි උන්නතාංශයක විහිදී ගිය ගස් කපා ඉවත් කිරීම සම්බන්ධයෙන් පනවන ලද සීමාවන් හේතුවෙන් දැව අලෙවි ආදායම පහළ බැසීමේ අභියෝගයත් සමඟ උද්ගත වූ ද්‍රවශීලතා ගැටළු හමුවේ වුවද ආයතනයේ ලාභදායීත්වය පවත්වා ගැනීමට රාජ්‍ය දැව සංස්ථාව සමත්ව ඇත. එනමුත් ලාභයෙන් සියයට 50 කටත් වඩා වැඩි ප්‍රමාණයක් සමන්විත වනුයේ පොළී ආදායමෙනි. | විදේශීය වෙළෙඳපොළ අපනයන අවස්ථාවන්ද ඇතුළුව ගුණාත්මක බවින් ඉහළ ගෘහ භාණ්ඩ සඳහා විශේෂිත පාරිභෝගික අවශ්‍යතා ඉලක්ක කොටගත් වෙළෙඳපොළ (niche market) අවස්ථාවන් උකහාගත හැකි වන පරිදි ගෘහ භාණ්ඩ නිෂ්පාදනයේදී උපාය මාර්ගික සහයෝගිතාවන් ගොඩනැඟීම.<br>අගය එකතු කල, පරිසර හිතකාමී ගෘහභාණ්ඩ නිෂ්පාදනය කෙරෙහි අවධානය යොමු කිරීම.<br>උපරිම දැව පරිමාවක් ලබා ගැනීම සඳහා දැව කඳන් හෙළීමේදී සිදුවන නාස්තිය හැකිතරම් අවම කිරීමට කටයුතු යෙදීම. |
| පොහොර | **සීමාසහිත ලංකා පොහොර සමාගම**<br>රජයේ පොහොර සහනාධාර වැඩපිළිවෙල වටතේ සියයට 65ක පොහොර ප්‍රමාණයක් ආනයනය කිරීම, මිශ්‍ර කිරීම හා බෙදා හැරීම යන කාර්යයන්හි නිරත ප්‍රධාන රාජ්‍ය ආයතනය ලංකා පොහොර සංස්ථාවයි. 2014 දක්වා වෙනත් භෝග සඳහා වන සහනාධාරයෙන් සියයට 90 ක් පෞද්ගලික අංශය මගින් පාලනය කරන ලදි. 2014 වර්ෂයේ මෙයින් සියයට 40 ක් රාජ්‍ය අංශය වෙත පවරන ලද අතර ඒ හේතුකොටගෙන මෙම ආයතනයේ පිරිවැටුම සියයට 27 කින් ඉහල ගොස් ඇති අතර 2013/2014 වසරේ මෙ. ටො. 199,000ක් වූ එම පොහොර ප්‍රමාණය මෙ.ටො. 212,000 දක්වා ඉහල ගොස් ඇත.<br>2013/2014 වර්ෂයේ වූ රු මිලියන 241ක බදු පෙර ලාභය 2013/2014 වර්ෂයේදී රු මිලියන 288 ක් දක්වා වර්ධනය වී ඇත. මෙම ප්‍රගතියත් සමග ලංකා පොහොර සමාගම ලාභාංශ ලෙස රු මිලියන 38 ක් රජයට ලබාදීමට හැකියාව ලැබී ඇත. | වගා බිම් ආශ්‍රිත ගබඩා පහසුකම් දියුණු කිරීම මගින් ඵලදායී ලෙස පොහොර බෙදා හැරීම සිදුවන බවට වග බලා ගැනීම අත්‍යාවශ්‍ය වනු ඇත. තවද වෙනත් භෝග සඳහා පොහොර ලබා දීමේදී මතුව ඇති බාධාවන් සැලකිල්ලට ගෙන ආයතනය ගබඩා පහසුකම් ඇති කිරීම හා මිශ්‍රණ පහසුකම් ඉහල නැංවීම සඳහා ආයතනයේ ආයෝජනය මෙහෙය විය යුතුය. |
| | **සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම**<br>වෙනත් භෝග සඳහා වන පොහොර සහනාධාරයෙන් සියයට 40 ක් රජයේ ආයතන සඳහා විවෘත වීමත් සමග කොළඹ කොමර්ෂල් පොහොර සමාගමේ පිරිවැටුම සියයට 15.5 කින් හෙවත් රු මිලියන 1372 හි සිට 2014 දී රු. මිලියන 1625 දක්වා ඉහල ගොස් ඇත. මෙම වසර තුලදී බදු පෙර ලාභය සියයට 75 කින් වර්ධයවී ඇත. | රජයේ පොහොර සහනාධාර වැඩපිළිවෙල යථාර්ථයක් බවට පත් කර ගැනීම උදෙසා පොහොර හිඟයන් හා අතිරික්ත මිලට ගැනීම වළක්වා ගනිමින් කලට වේලාවට ගොවීන්ට පොහොර සැපයීම කොළඹ කොමර්ෂල් පොහොර සමාගමේ ප්‍රධාන කාර්ය භාරය විය යුතුය |
| රක්ෂණය | **ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව**<br>සියයට 23 ක වැටුප් වැඩිවීමක් සහ වසරින් වසර සියයට 5 ක වැටුප් වර්ධනයක් සමඟ 2013-2016 කාල පරිච්ඡේදය සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ සාමූහික ගිවිසුම වසර තුලදී අත්සන් තබන ලදී. | රටේ රක්ෂණ සඳහා දායක වීම පහළ අනුපාතයක පවතින බැවින් ව්‍යාප්ත වීම සඳහා විශාල අවස්ථාවක් පවතින අතර ප්‍රවේශ නොවූ වෙළඳපලවල් වෙත ව්‍යාප්ත වීම සඳහා නව |

| | | |
|---|---|---|
| | **කෘෂිකාර්මික හා ගොවි රක්ෂණ මණ්ඩලය**<br><br>තාවකාලිකව අත්හිටවනු ලැබූ ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ඉහල නැංවූ විශ්‍රාම ප්‍රතිලාභ සමඟින් වසර තුලදී නැවත ක්‍රියාත්මක කරන ලදී. | ව්‍යාපාර ප්‍රවර්ධන උපායමාර්ග ක්‍රියාත්මක කළ යුතු වේ.<br><br>විවිධාංගිකරණ හා නම්‍යශීලි නිෂ්පාදන වැනි විකල්පීය තරඟකාරීත්වයන් මඟින් වඩා හොඳ ප්‍රාරක්ෂණයක් ප්‍රචලිත කළ යුතු වේ. |
| පශු සම්පත් | **මිල්කෝ ආයතනය**<br><br>මිල්කෝ ආයතනයට ලාභය ඉහළ නංවා ගැනීම උදෙසා තරඟකාරී ලෙස තම නිෂ්පාදන වල මිල සංශෝධනය කිරීමට පහසුකම් සලසා දෙන ලදී.<br><br>අඹේවෙල, දිගන හා පොළොන්නරුවේ පිහිටි කර්මාන්තශාලා තුන නවීකරණයට යූරෝ මිලියන 33.8 ක ණය මුදලක් ලබා ගැනීම සඳහා පහසුකම් සළසා දෙන ලදී. දැනටමත් කර්මාන්තශාලා දෙකක නවීකරණ කටයුතු අවසන් වී ඇති අතර අනෙක් කර්මාන්තශාලාවේ (අඹේවෙල) නවීකරණ කටයුතු 2015 වසර අවසාන වන විට නිම වීමට නියමිතව ඇත.<br><br>**ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය**<br><br>ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට ඉහළ ඵලදායීතාවෙයන් යුත් තවත් කිරි දෙනුන් 2500 ක් ආනයනය කිරීම සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 20 ක ණය මුදලක් ලබා ගැනීමට පහසුකම් සලසා දෙන ලදී.<br><br>එළඹෙන මාස තුනක කාල පරාසය තුළ ආනයනය කිරීමට අපේක්ෂිත දෙනුන් ප්‍රමාණයෙන් භාගයක් ආනයනයට කටයුතු සලසා ඇති අතර ඔවුන් රිදියගම ගොවිපලේ ගාල් කිරීමට බලාපොරොත්තුවේ. | දියර කිරි සඳහා වන මෙතෙක් අත්පත් කර නොගත් ඉල්ලුමෙන් ප්‍රයෝජන ගැනීම සඳහා වෙළඳපොළ නියෝජිතයන් ධෛර්යමත් කිරීම හා දියර කිරි භාවිතය ප්‍රවර්ධනය කිරීම.<br><br>මිල්කෝ සමාගම රටේ දියර කිරි පරිභෝජනය දිරිමත් කිරීම උදෙසා නව වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම හා තම කර්මාන්තශාලා නවීකරණයට කටයුතු කිරීම.<br><br>කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන වෙළඳපොළ විධිමත් කිරීම සඳහා සාම්ප්‍රදායික හා අවිධිමත් වෙළඳපොළ හඳුනාගැනීම සහ සුදුසු හා කාර්යක්ෂම වෙළඳපොළ යාන්ත්‍රණයක් හඳුන්වාදීම.<br><br>රටේ ජනතාව අතර නැවුම් කිරි පරිභෝජනය ඉහළ නැංවීම උදෙසා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය විසින් නැවුම් කිරි අලෙවි සැල් 79 ක් ප්‍රධාන නගර ආශ්‍රිතව විවෘත කිරීම. |
| වැවිලි<br><br>කර්මාන්ත | ප්‍රාදේශීය වැවිලි සමාගම් වල කාර්යසාධනය ඇගයීම සඳහා කමිටුවක් පත්කර කාර්යසාධන දර්ශක සකස් කරන ලදී.<br><br>රජය සතු වැවිලිආයතන වල (ඇල්කඩුව, ශ්‍රී.ල.රා.වැ.සං, ජනවසම) දැව නෙලීමේ ප්‍රගතිය හා හිඟ හිට ඇති ව්‍යවස්ථාපිත වගකීම් නිරවුල් කිරීම පිළිබඳ පසු විපරම් කිරීම<br><br>විගනකාධිපතිවරයා විසින් පෙන්වා දෙන ලද කරුණු සම්බන්ධව සහ පොදු ව්‍යාපාර කාරක සභා නිර්දේශයන් සඳහා ගනු ලැබූ පිළියම් පිළිබඳ පසු විපරම් කිරීම | නිෂ්පාදන පිරිවැය අඩුකිරීමට හා අස්වැන්න වැඩි කිරීම සඳහා ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම.<br>අවශ්‍ය අවස්ථාවන් වලදී නව තාක්ෂණය හා ප්‍රාග්ධනය යෙදවීම, කර්මාන්තයේ වෙනස්වීම් වලට ගැලපෙන ලෙස නවීන තාක්ෂණය යොදා ගැනීම කාර්යය සාධනය හා නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීම සඳහා ඵලදායී කළමනාකරණ උපාය මාර්ග සැකසීම<br>අමුද්‍රව්‍ය නිෂ්පාදන වෙනුවට ඉහළ එකතු කළ අගයක් සහිත නිෂ්පාදන වෙත යොමු වීම තේ නිෂ්පාදන වල ගුණත්වය ඉහළ නැංවීමටත් මෙහෙයුම් කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමටත් හැකිවන පරිදි අමු තේ සැකසීම සඳහා නව ස්වයංක්‍රීය යාන්ත්‍රික පද්ධතීන් හඳුන්වාදීම.<br>දේශිය හා විදේශීය තේ නිෂ්පාදනකරුවන් අතර තරඟකාරීත්වය පවත්වා ගැනීම සඳහා අගය එකතු කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව දැනුම හා පුහුණුව ලබාදීම |

| | | |
|---|---|---|
| | | නිෂ්පාදකතාවය වැඩිදියුණු කිරිම සඳහා අවශ්‍ය අවස්ථාවලදී නැවත වගා කිරීම වේගවත් කිරීම. |
| පුනර්ජනනීය නොවන සම්පත් | වාර්ෂික මහා සභා රැස්වීම් සඳහා සහභාගි වූ අතර රාජ්‍ය ව්‍යාපාරවල යහපාලනය ඇති කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැන උපදෙස් ලබා දුන් අතර ලාභාංශ ගෙවීමේදී ඇතිවන බද්ද සංකූලතා පෙන්වා දෙන ලදී. | ප්‍රමාණවත් එකතු කළ වටිනාකමක් ආර්ථිකයට ලබා දීම සඳහා සැලකිය යුතු ප්‍රාග්ධන ප්‍රමාණයක් ලබා දීම අවශ්‍ය වේ.<br><br>අනාගතයේදී වැඩි වන ඉල්ලුමට ප්‍රතිචාර දැක්වීම සඳහා මෙම සම්පත් ක්‍රමානුකූලව උපයෝජනය කිරීම වැදගත් වේ. |
| සෞඛ්‍යය | **ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව**<br><br>සංස්ථාවේ නිෂ්පාදනය වැඩිදියුණු කිරීම උදෙසා දිරිදීමනා ක්‍රමයක් හඳුන්වා දීමට මූලික කටයුතු සිදුකරන ලද අතර, මුල්‍ය හා කාර්යයමණ්ඩල පාලන කටයුතු සම්බන්ධයෙන් වන ගැටළු මෙන්ම විගණන විමසුම් සම්බන්ධයෙන්ද රැස්වීම් කිහිපයක් පවත්වන ලදී. | හඳුනාගත් සංචාරක කේන්ද්‍රස්ථාන ඇතුලත්ව ඉහළ යන වෙළඳපොල ඉල්ලුම වෙනුවෙන් නවනිෂ්පාදන හා ආයුර්වේද ඖෂධ සඳහා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.<br><br>නිෂ්පාදන ධාරිතාවය වැඩි දියුණු කිරීම සඳහා නාවින්න ඉඩමේ වැඩි දියුණු කිරීමේ කටයුතු සිදුකරන ලදී.<br><br>සංස්ථා පරිශ්‍රය තුල වූ ගබඩා සංකීර්ණය 2014 වසරේ තවදුරටත් සංවර්ධනය කරන ලදී. |
| | **රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව**<br><br>රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ සාමුහික ගිවිසුම සඳහා අනුමැතිය ලබාදීම වෙනුවෙන් පහසුකම් සලසන ලදී.<br><br>රෝහල් ජාලය වෙත ඖෂධ පහසුවෙන් සැපයීම පිණිස රාජ්‍ය බැංකු අයිරා ලබාගැනීමට පහසුකම් සපයන ලදී. | සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවන්ට අනුව ඖෂධ ප්‍රසම්පාදනයන් සිදුකර ඇත. ද්‍රවශීලතා ගැටළු අවම කිරීම සඳහා ප්‍රසම්පාදන කළමනාකරණය කර බෙදාහැරීම් හා ගබඩා ක්‍රමවේද දියුණු කර ඇත.<br><br>භාණ්ඩාගාර සහාය තවදුරටත් නොලබා 2014 වසරේ සිට චක්‍රීය පහසුකම් වෙනුවෙන් වූ පිරිවැය ආවරණය කර ඇත. බැංකු සඳහා නොපිය වූ ණය රු.මි.6,254 සිට රු.මි.79 දක්වා අඩු කර ගැනීමට සමත්ව තිබේ. පෙර වසරට සාපේක්ෂව 2014 වසරේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට වන විකුණුම් සියයට 4 කින් ඉහළ නංවා ගෙන ඇත. |
| | **රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව**<br><br>සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට හා පෞද්ගලික අංශයට අවශ්‍ය වන ඖෂධ අඛණ්ඩව සැපයීම වෙනුවෙන් චක්‍රීය පහසුකම් ලබාදෙනලදී.<br><br>සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ පැරසිටමෝල් සඳහා වන ඇණවුම් කිරීම සපුරාලීම සඳහා ඉහල තාක්ෂණයෙන් යුත් යන්ත්‍රයක් නිෂ්පාදන දෙපාර්තමේන්තුව වෙත හඳුන්වා දී තිබේ.<br><br>JICA ආයතනය හරහා ණය ලබා ගනිමින් කාර්යයන් පුළුල් කර ඇත. 2017 වසරේ ව්‍යාපෘතිය අවසන්වන විට අපේක්ෂිත නිමැවුම පෙති ඒකක 3500 වනු ඇත. මෙම ව්‍යාපෘතිය තුලින් නව යන්ත්‍ර, ගොඩනැගිලි නවීකරණය, අමුද්‍රව්‍ය හා නිමැවුම් වෙනුවෙන් ගබඩා ගොඩනැගිල්ල ඉදිකිරීම සිදු කර ඇත. | සියලුම රජයේ රෝහල් වල ඖෂධ අවශ්‍යතාව සපුරාලීම සඳහා එහි නිෂ්පාදන ක්‍රියාවලිය සවිමත් කරමින් ඉහළ තාක්ෂණය යොදා ගෙන ඇත. |

| | | |
|---|---|---|
| | **ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල**<br><br>රෝහලේ කාර්යයසාධනය වෙනුවෙන් සභාපති සහ අදාල නිලධාරින් සමඟ සාකච්ඡා කිහිපයක් පවත්වන ලදී.<br><br>2014 වසර තුල රු.මි.1,888 ක් පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් වෙන් කර ඇත. | ගෙවීම් සිදුකරන වාට්ටු සඳහා පාරිභෝගිකයන් ආකර්ෂණය පිණිස ප්‍රවර්ධන උපාය මාර්ග ක්‍රියාත්මක කරන ලදී.<br><br>විශේෂ වෛද්‍ය ඒකකයන්හි නවීකරණ හා භෞතික පුළුල් කිරීම් සම්බන්ධව කටයුතු සිදු කරන ලදී.<br><br>සියළුම වෛද්‍ය සහායක සේවා ලබාදිය හැකි පරිදි විශේෂ වාට්ටු වැඩි දියුණු කරන ලද අතර ඉහළ ලාභදායිත්වයකට ලඟා විය හැකි පරිදි එහි මිලකරණය සකස් කරන ලදී. |
